## චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය.-2012

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු**

සංස්ථා භාරය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

**1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ආරම්භක ප්‍රදානයක් වශයෙන් රුපියල් දස ලක්ෂයක මුදලක් අරමුදලට ලබා දිය යුතු වුවද එසේ ලබාදුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

**1.2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි 11 වගන්තිය 3 උප වගන්තිය | ආදායම් හා වියදම් ගිණුමට සහ ශේෂ පත්‍රයට අත්සන් කිරීම සඳහා මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් බලය දෙන ලද මණ්ඩලයේ සමාජිකයින් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2002 ජුනි 12 දිනැති අංක පීඑෆ / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියේ (ආ ) උපවගන්තිය | 2012 දෙසැම්බර් 31 දිනට රු. 400,000 ක් වූ ස්ථාවර තැන්පත් ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සංස්ථා භාරයේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 180,328 ක අතිරික්තයක් වූ අතර , ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ වූ ඌනතාවය රු. 73,963 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 254,291 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආයෝජන මත වූ පොලී ආදායම වැඩිවීම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

1998 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ වර්ෂ 14 ක් තුළදී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර හා මරණාධාර වශයෙන් එකතුව රු. 18,729,980 ක් ප්‍රදානය කර තිබුණි.

මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාමිකයන් 42 දෙනෙකු වෙනුවෙන් මසකට රු. 2,000 බැගින් විශ්‍රාම වැටුප් වශයෙන් රු. 1,036,000 ක් ද, වර්ෂය තුළදී මියගිය විශ්‍රාමිකයින් 03 දෙනෙකුගෙන් එක් අයකුට පමණක් මරණාධාර ලෙස රු. 10,000 ක් ද, වශයෙන් එකතු වටිනාකම රු. 1,046,000 ක් ගෙවා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් ප්‍රදානය සඳහා සුදුසුකම් ලබන කලාකරුවන් හා කාර්මිකයන් වාර්ෂිකව තෝරාගෙන ඔවුන් විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරගත යුතු වුවද 2005 වර්ෂයෙන් පසු එවැනි තෝරා ගැනීමක් කර නොතිබුණි. තවද 2005 වර්ෂයේදී 5 දෙනෙකු පමණක් එකී අරමුදලට දායක කරගෙන තිබූ අතර 2004 වර්ෂයේද සුදුසුකම් ලැබ තිබූ කලාකරුවන් 8 දෙනෙකු 2013 ජුනි 30 වන විටත් අරමුදලට දායක කරගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.2.1 පනතේ අරමුණු සාක්ෂාත් කර නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 3 වන වගන්තියට අනුව භාරයෙහි පරිපාලනය, කළමනාකරණය, සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලය පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී රැස්ව තිබුණේ එක් වරක් පමණි.

(ආ) පනතේ 5 වන වගන්තිය යටතේ වූ පහත සඳහන් පරමාර්ථ 2012 වර්ෂයේදීද, ඉටුකර ගෙන නොතිබුණි.

(i) චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට ආධාර පිණිස යහසාධක අරමුදල්, ඉතිරිකිරීමේ අරමුදල්, ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ii) සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ කාර්මිකයන්ට වයස අවුරුදු හැට එළඹීමෙන් පසු ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම.

(ඇ) සංස්ථා භාරයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර තිබූ රීති මාලාව අවසාන වරට සංශෝධනය කර තිබුණේ 2003 වර්ෂයේදී වන අතර රු. 2,000 ක් වන මාසික විශ්‍රාම දායක මුදල වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන පරිදි වැඩි කිරීම සහ දායකත්වය සඳහා සුදුසුකම් ලබන මාසික ආදායම් සීමාව වන රු. 3,000 වැඩිකිරීමටද කටයුතු කර නොතිබුණි.

### 3.2.2 ක්‍රියාත්මක නොවූ භාරකාර මණ්ඩල තීරණ

භාරය සතු ස්ථාවර තැන්පතු වලින් ලැබෙන වාර්ෂික පොලිය හා චිත්‍රපට සංස්ථාවෙන් භාරයට ලැබෙන රු. 200,000 මුදලින් විශ්‍රාමලාභීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර, භාරයේ මල්‍ය තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා 2004 සැප්තැම්බර් 21 දින පැවැති 79 වන භාරකාර මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ වැදගත් තීරණ රාශියක් 2012 වර්ෂයේදීද ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම තත්ත්වය පසුගිය විගණන වාර්තා වලින්ද පෙන්වා දී තිබූ නමුත් එම කාර්යයන් සිදුකිරීම සඳහා භාරය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

3.2.3 1985 වර්ෂයෙදී රුක්මණී දේවි අනුස්මරණ අරමුදල උපයෝගී කර ගෙන ගායකයකුට ඉන්දියාවේ "පූනා" චිත්‍රපට ආයතනයේ පශ්චාත් උපාධියක් ලබාදීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීත් යෝජිත ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලේ වටිනාකම රු. 462,778 ක් විය.

3.2.4 භාණ්ඩාගාර බිල්පත් ශේෂ සනාථ කිරීම් අනුව රු. 5,529,948 වටිනා භාණ්ඩාගාර බිල්පත් දින 182 ක කාලයකට තැන්පත් කර තිබූ අතර එයින් රු.5,000,000 ක් 2012 ජුලි සිට දින 91 ක් සඳහා සියයට 11 පොලියකටත් 2012 ඔක්තොම්බර් සිට දින 98 ක් සඳහා සියයට 10.8 පොලියකටත් අවස්ථා දෙකකදී තැන්පතු අළුත් කර තිබුණි. ඒ අනුව දින 182 ක කාලයක එම මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනයේදී නිර්දේශිත පොලිය සියයට 12.75 විය යුතු බව නිරීක්ෂණය ව අතර මූලික තැන්පතුවෙන් හිමිවිය යුතු පොලී ආදායම රු. 29,535 ක් අඩුවෙන් ගණනය කර අරමුදලට ප්‍රේෂණය කර තිබූ අතර අරමුදල එම මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 ආර්ථික නොවූ ගනුදෙනු

1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාර පනතේ 5 වන වගන්තියෙන් දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු රීති මාලාවේ 12 ප්‍රකාරව අරමුදල වැඩි දියුණු කර ගැනිමට හැකි වන පරිදි මාසිකව ගෙවීමට ප්‍රමාණවත් මුදල් පමණක් රඳවාගෙන සෙසු මුදල් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතුය. මාසයක සාමාන්‍ය වියදම රු. 100,000 හා රු. 150,000 අතර ප්‍රමාණයක් වූ අතර මසකට සාමාන්‍යයෙන් රු. මිලියන 1 සිට රු. මිලියන 1.5 දක්වා වූ අතිරික්ත මුදල් ප්‍රමාණයක් බැංකු ජංගම ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, සංස්ථා භාරය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 03 ක් ප්‍රමාදයකින් පසුව 2013 ජුනි 06 දිනදිය.

## 4.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු භාරයේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම

(ඈ) ගිණුම් පොත් පත්, ලේඛන නඩත්තුව

(ඉ) ආයෝජන